සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය | **පුරවැසි අධ්‍යාපනය - I, II** | **කාලය පැය 03 යි**

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

නම/ විභාග අංකය:

I - කොටස

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. තීන්දු ගැනීමේ ක්‍රියාවලියට පුරවැසියන් සියලු දෙනාම සම්බන්ධ වන පාලන ක්‍රමය වන්නේ,
(1) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යි. (2) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යි.
(3) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යි. (4) අර්ධ ප්‍රජාතන්ත්‍රවාදය යි.

02. ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ ක්‍රියාවලිය ආරම්භ වන්නේ,
(1) 1917 රුසියන් විප්ලවයෙන් පසුය. (2) 1976 ඇමරිකන් විප්ලවයෙන් පසුය.
(3) 1789 ප්‍රංශ විප්ලවයෙන් පසුය. (4) 1688 ඉංග්‍රීසි විප්ලවයෙන් පසුය.

03. ග්‍රීසියේ ඇතැන්ස්හි පැවති ප්‍රධාන පාලන ආයතනය වන්නේ,
(1) පළාත් සභාව යි. (2) පුරවැසි සභාව යි.
(3) නගර සභාව යි. (4) විධායක සභාව යි.

04. ක්‍රි පූ 6 වන සියවසේ සප්ත අපරිහානීය ධර්ම අනුගමනය කළ ඉන්දියාවේ ජනපදය මින් කුමක් ද ?
(1) වත්ස ජනපදය. (2) ගාන්ධාර ජනපදය. (3) වජ්ජි ජනපදය. (4) අවන්ති ජනපදය.

05. ස්විස්ටර්ලන්තය තුළ පවතින ප්‍රාදේශීය ආණ්ඩු හඳුන්වන්නේ කුමන නමකින් ද ?
(1) කැන්ටන් (2) ප්‍රාන්ත (3) නගර සභා (4) පළාත් ආණ්ඩු

06. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක බලයේ අවසාන හිමිකරුවා වන්නේ,
(1) අගමැතිවරයා ය. (2) ජනාධිපතිවරයා ය. (3) පාලකයා ය. (4) ජනතාව ය.

07. ශ්‍රී ලංකාවේ වයඹ පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක වන්නේ,
(1) කුරුණෑගල, කෑගල්ල (2) කුරුණෑගල, පුත්තලම
(3) කුරුණෑගල, හලාවත (4) කුරුණෑගල, කුලියාපිටිය

08. ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ගයක් වන්නේ,
(1) ඉස්ලාම් (2) හින්දු (3) මැලේ (4) කතෝලික

09. ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන ප්‍රධාන මූලයක් නොවන්නේ මින් කුමක් ද?
(1) වාර්ගිකත්වය. (2) දේශපාලනය.
(3) සමාජ ආර්ථික තත්වය. (4) සමානාත්මතාවය.

Past Papers Wiki

10. සමාජවාදී අර්ථ ක්‍රමයක් පවතින රටවල් 02 ක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) උතුරු කොරියාව, කියුබාව (2) කියුබාව, ඇමරිකාව
(3) බ්‍රිතාන්‍ය, ඇමරිකාව (4) ජපානය, ඕස්ට්‍රේලියාව

11. ආර්ථික භාණ්ඩයක් හා ආර්ථික නොවන භාණ්ඩයක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ඖෂධ, ඇඳුම් (2) ජලය, වාතය (3) ඇඳුම්, වාතය (4) හිරු එළිය, වාතය

12. සමාජවාදී අර්ථ ක්‍රමයක් පැවත වර්තමානයේ වෙළඳපොළ ආර්ථික සංකල්පය ක්‍රියාත්මක කරමින් සිටින රටක් වන්නේ,
(1) කොරියාව (2) පෝලන්තය (3) ජපානය (4) නෙදර්ලන්තය

13. ''වෙනස්කම් තුළින් එකමුතු බව'' යන්න තේමා කර ගනිමින් බහු සංස්කෘතික භාවය සංවර්ධනය සඳහා හොඳින් ප්‍රයේජනයට ගත් සංවර්ධිත රටක් වන්නේ,
(1) සිංගප්පූරුව (2) ඉන්දියාව (3) චීනය (4) පකිස්ථානය

14. BIMSTEC සංවිධානයේ සාමාජික නොවන රාජ්‍යය ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) මියන්මාරය (2) ශ්‍රී ලංකාව (3) ඉන්දියාව (4) පකිස්ථානය

15. ගැල්ටුන්ගේ ගැටුම් ත්‍රිකෝණයට අනුව ගැටුම් නිර්මාණය වීම සඳහා බලපාන මනෝ විද්‍යාත්මක සාධකය වන්නේ මින් කුමන සාධකය ද ?
(1) සන්ධර්භය (2) චර්යාව (3) ආකල්ප (4) විනය

16. ''විවිධත්වය තුළින් ඒකීයත්වය ළඟා කර ගැනීමට මග සාදන ආණ්ඩු ක්‍රමය සන්ධිය ආණ්ඩු ක්‍රමය වේ''. මෙම ප්‍රකාශය කළ දේශපාලන විද්‍යාඥයා වන්නේ,
(1) කේ. සී. වියර් (2) ඒ. වී. ඩයිසි (3) ප්ලේටෝ (4) ඇරිස්ටෝටල්

17. ශ්‍රී ලංකාවේ මුලින්ම පිහිට වූ මහ නගර සභා දෙක වන්නේ,
(1) කොළඹ, මහනුවර (2) කොළඹ, ගාල්ල (3) කොළඹ, මාතර (4) කොළඹ, යාපනය

18. තම දේශපාලන ආර්ථික හා සමාජීය අවශ්‍යතා ඉටු කර ගැනීමට පුද්ගලයාට සමාජයෙන් ලැබෙන ඉඩකඩ හඳුන්වන්නේ,
(1) අයිතිවාසිකම් යනුවෙනි. (2) සමානාත්මතාවය යනුවෙනි.
(3) නිදහස යනුවෙනි. (4) යුතුකම් යනුවෙනි.

19. ආණ්ඩුවේ ප්‍රධාන අවයවයක් වන්නේ මින් කුමක් ද ?
(1) භූමිය (2) ස්වාධිපත්‍යය (3) විධායකය (4) ජනගහනය

20. ඇමරිකාව සම්බන්දයෙන් වූ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සාමූහික විධායකයක් ක්‍රියාත්මක වේ.
(2) ව්‍යවස්ථාදායකය සන්ධිය මහා මණ්ඩලය ලෙස හඳුන්වයි.
(3) විධායකය සන්ධිය සභාව නමින් හඳුන්වයි.
(4) වර්තමානයේ ප්‍රාන්ත 50 ක් ඇත.

21. සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කර ඇති චින්තකයින් දෙදෙනෙකු නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ටී. බී. ටයිලර්, ඒ. ටී. හීලර් (2) ඒ. වී. ඩයිසි, කේ. සී. වියර්
(3) සී. එෆ්. ස්ට්‍රෝන්ග්, ගානර් (4) අයිවර් ජෙනිංග්ස්, ජී. ඩී. එච්. කෝල්

22. බලය විමද්‍යගත කර ඇති රාජ්‍යයන් හඳුන්වන්නේ,

(1) සන්ධීය රාජ්‍යය යනුවෙනි. (2) අර්ධ සන්ධීය රාජ්‍යය යනුවෙනි.

(3) ඒකීය රාජ්‍යය යනුවෙනි. (4) ප්‍රාන්ත රාජ්‍යය යනුවෙනි.

23. නීතිමය යුතුකමක් වන්නේ,

(1) වැඩිහිටියන්ට සැලකීම. (2) නීතිය ආරක්ෂා කිරීමට සහාය වීම.

(3) සමාජ සිරිත් විරිත් පිළිපැදීම. (4) දෙමාපියන්ට සැලකීම.

24. ප්‍රාග්ධන භාණ්ඩයකට උදාහරණයක් වන්නේ,

(1) ඇඳුම් (2) ආහාර ද්‍රව්‍ය (3) වාහන (4) පොහොර

25. 1977 පෙර ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තියේ විශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) කාර්මික අංශයට වැඩි සැලකිල්ලක් දැක්වීම. (2) විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීම.

(3) ආනයන සීමා ලිහිල් කිරීම. (4) ආනයන සඳහා සීමා පැනවීම.

26. වර්තමානයේ රාජ්‍යයට පැවරෙන කාර්යයක් නොවන්නේ මින් කුමක් ද ?

(1) ආණ්ඩු පක්ෂයට සැළකීම. (2) නීතිය හා සාමය ආරක්ෂා කිරීම.

(3) පොදු සේවා පවත්වාගෙන යාම. (4) නීතිය හා සාමය ආරක්ෂා කිරීම.

27. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කර ගන්නා ලද්දේ,

(1) 1948 පෙබරවාරි 04 දින ය. (2) 1978 මාර්තු 05 දින ය.

(3) 1948 දෙසැම්බර් 10 දින ය. (4) 1948 පෙබරවාරි 10 දින ය.

28. ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) ගෝලීය වෙළඳ පොළ හැකිලීම.

(2) වැඩ ලෝකය පුළුල් වීම.

(3) තම රටේ පමණක් ජීවත්වීමට හැකිවීම.

(4) තම හැකියාවන් අනුව වෙනත් රටකට යාමට නොහැකි වීම.

29. එක්සත් ජාතීන්ගේ සංවිධානය 2000 දී සම්මත කරගත් සහස්‍රක සංවර්ධන ඉලක්කයක් වන්නේ,

(1) මානසික සෞඛ්‍ය වර්ධනය. (2) ළදරු මරණ අනුපාතිකය වැඩි කිරීම.

(3) දුප්පත්කම හා සාගින්න වැඩි කිරීම. (4) මැලේරියාව වැනි රෝග වර්ධනය කිරීම.

30. ගැටුම් නිරාකරණ ක්‍රමවේදයක් ලෙස මැදිහත්කරණය යොදා ගත හැකි අවස්ථාවක් වන්නේ,

(1) පවුල් ආරවුල් (2) මුදල් පිළිබඳ ආරවුල්

(3) විනය පරීක්ෂණ (4) සේවක ගැටුම්

31. රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතුවක් වන්නේ,

(1) රාජ්‍යය පාලනයේ කාර්යක්ෂමතාව. (2) රාජ්‍යය පාලකයින් වගකීමෙන් යුතු වීම.

(3) රාජ්‍යය සේවය නිර්දේශපාලනීකරණය වීම. (4) නිළධාරීවාදය.

32. ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමවේදයක් ලෙස දෙපාර්ශවයටම ''ජය-ජය'' විසඳුම් ලබා ගත හැකි ගැටුම් නිරාකරණ ක්‍රමවේදය වන්නේ,

(1) සාකච්ඡා ක්‍රමය. (2) සමථකරණය. (3) උපදේශනය. (4) විනිසීම.

33. ගෝලීයකරණය සඳහා ගැලපෙන නිර්වචනය වන්නේ,

(1) සම්ප්‍රදායික සංනිවේදන ක්‍රම භාවිතා කරමින් සබඳතා පවත්වා ගැනීම.

(2) තාක්ෂණයේ දියුණුව කුඩා ක්ෂේත්‍රයකට පමණක් සීමා වීම.

(3) විද්‍යාව හා තාක්ෂණය පදනම් කර ගෙන ලෝකයේ සෑම අංශයක්ම එකට සම්බන්ධ වීම.

(4) ආර්ථික හා දේශපාලන සඳහා මෙය බලපාන්නේ නැත.

34. සාර්ව ගැටුමකට උදාහරණයක් වන්නේ මින් කුමක් ද?

(1) ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය. (2) ආගම් අතර ඇතිවන ගැටුම්.

(3) ඉඩම් ආරවුල්. (4) පුද්ගලයා තුළ ඇතිවන මානසික ගැටුම්.

35. ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාශ බෙදා වෙන් කරනු ලබන්නේ,

(1) අධිකරණය විසිනි.

(2) ජනාධිපතිවරයා විසිනි.

(3) පාර්ලිමේන්තුව විසිනි.

(4) මැතිවරණ සීමා නිර්ණය කොමිෂන් සභාව විසිනි.

36. ක්‍රි.ව 5 වන සියවසේ සිට 15 වන සියවස දක්වා යුරෝපයේ පැවති සමාජ ක්‍රමය වූයේ,

(1) වැඩවසම් සමාජ ක්‍රමය යි. (2) ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමය යි.

(3) සමාජවාදී සමාජ ක්‍රමය යි. (4) ධනවාදී සමාජ ක්‍රමය යි.

37. ගැටුම් නිරාකරණය සඳහා යොදා ගනු ලබන සම්ප්‍රදායික ක්‍රමය වන්නේ,

(1) උපදේශනය. (2) බේරුම් කිරීම.

(3) විනිසීම. (4) සමථකරණය.

38 පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය වන්නේ මින් කුමක් ද?

(1) මහ නගර සභාව. (2) නගර සභාව.

(3) ප්‍රාදේශීය සභාව. (4) මහ සභාව.

39. පහත දක්වා ඇති කරුණු ආශ්‍රයෙන් 39 සහ 40 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - සංවේදී බව. B - සාධාරණත්වය.

C - සහානුභූතිය. D - ඉවසීම.

E - මුදිතාව. F - සවන් දීම.

39. ගැටුම් නිරාකරණය සඳහා පුද්ගලයෙකු තුළ තිබිය යුතු පුද්ගල ගුණාංග ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A B C (2) A C E (3) A D E (4) B C F

40. ගැටුම් නිරාකරණය සඳහා පුද්ගලයෙකු තුළ තිබිය යුතු සමාජීය ගුණාංග ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A B C (2) A C E (3) A D E (4) B C F

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

පුරවැසි අධ්‍යාපනය

නම/ විභාග අංකය:

II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

01. (i) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කර ඇති චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.

(ii) බලය විවිධ ස්වරූප වලින් පවතී.ඉන් ස්වරූප දෙකක් ලියන්න.

(iii) ශ්‍රී ලංකාවේ පවතින භාෂාවන් දෙකක් ලියන්න.

(iv) වෙළඳාම බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක ලියන්න.

(v) ගැටුම් ඇතිවීම සඳහා පුද්ගල මනස මුල්වේ. එබැවින් මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමු විය හැකි අංශ දෙකක් ලියන්න.

(vi) ඒක පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවල් දෙකක් නම් කරන්න.

(vii) ඒකීය රාජ්‍යයක ලක්ෂණ දෙකක් ලියන්න.

(viii) ඉතා සංකීර්ණ බහු සංස්කෘතික සමාජයන් ඇති රටවල් දෙකක් නම් කරන්න.

(ix) කෘෂිකාර්මික නිෂ්පාදන දෙකක් ලියන්න.

(x) සාර්ක් සංවිධානයේ සාමාජික රටවල් දෙකක් නම් කරන්න.

02. ලෝකයේ වඩාත් ප්‍රචලිත හා ජනතාවට හිතකර පාලන ක්‍රමය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යි.

(i) පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු දෙකක් ලියන්න. (ල.02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම නිසා ලැබෙන. ප්‍රයෝජන තුනක් ලියන්න. (ල.03)

(iii) (a) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක දෙකක් ලියන්න. (ල.02)

(b) ඉහත (a) සඳහන් සාධක පැවතීම තුළින් පුරවැසියන්ට ලැබෙන වාසි දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න (ල.03)

03. සංස්කෘතික විවිධතා සහිත සමාජ ක්‍රම සමාජ විද්‍යාඥයින් විසින් බහුවිධ සමාජ ලෙස හඳුන්වා තිබේ.

(i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් ලියන්න. (ල.02)

(ii) යහපාලනයක මූලික ගුණාංග තුනක් ලියන්න. (ල.03)

(iii) (a) බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් ලියන්න. (ල.02)

(b) ඉහත (a) සඳහන් ගුණාංග පුරවැසියන් තුළ තිබීම නිසා ඇතිවන වාසි දෙකක් සඳහන් කර ඉන් එක් වාසියක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

04. මිනිසාට මුහුණ දීමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා යම් සමාජයක් සංවිධානය වී ඇති ආකාරය අර්ථ ක්‍රමයක් ලෙස හැඳින්වේ.

(i) නිෂ්පාදන සාධක දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) මූලික ආර්ථික ප්‍රශ්න තුන ලියන්න. (ල. 03)

(iii) (a) ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන ධනාත්මක බලපෑම් දෙකක් ලියන්න. (ල. 02)

(b) ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන සෘණාත්මක බලපෑම් දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

05. ගැටුම් සෑම සමාජයකම දක්නට ලැබේ. මිනිසුන් තුළ පවත්නා විවිධත්වය ගැටුම තුළින් පිළිබිඹු වේ.

(i) ගැටුම් ඇතිවන පාර්ශව දෙකක් ලියන්න. (ල.02)

(ii) ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීමේ වාසි තුනක් ලියන්න. (ල.03)

(iii) (a) අන්තර්ජාතික ගැටුම් බෙදනු ලබන ප්‍රධාන කොටස් දෙක ලියන්න. (ල.02)

(b) අන්තර්ජාතික ගැටුම් ඇතිවීම සඳහා බලපාන හේතූන් දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල 03)

06. බලය හසුරවනු ලබන අය තමන්ට කැමති ආකාරයට බලයට යටත් වන්නන් පාලනය කිරීමත්, ඔවුන් තම කැමැත්තට අවනත නොවන විට බල කිරීම මගින් අවනතභාවය ලබා ගැනීම බලය ලෙස හැඳින්විය හැකිය.

(i) බලය බෙදා හැරීමේදී මධ්‍යම ආණ්ඩුව සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ඒකක වෙත පවරා දෙයි එලෙස පවරා දෙන බලතල දෙකක් ලියන්න. (ල. 02)

(ii) සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

(b) සන්ධීය ආණ්ඩුක්‍රමයක අයහපත් ලක්ෂණ දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

07. සමාජයේ පවතින උසස් හා උත්තරීතර සංවිධානය වන්නේ රාජ්‍යයි.

(i) රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක ලියන්න. (ල. 02)

(ii) ජාතික රාජ්‍යය බිහි වීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) රාජ්‍යයෙන් පුරවැසියා කෙරෙහි ඉටු විය යුතු වගකීම් දෙකක් ලියන්න. (ල. 02)

(b) පුරවැසියෙකු විසින් ඉටු කළ යුතු නීතිමය යුතුකම් දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

Past Papers Wiki

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(1)	2 -(4)	3 -(2)	4 -(3)	5 -(1)	6 -(4)	7 -(2)	8 -(3)	9 -(4)	10 -(1)
11-(3)	12 -(2)	13 -(1)	14 -(4)	15 -(3)	16 -(2)	17 -(1)	18 -(3)	19 -(3)	20 -(4)
21-(1)	22 -(3)	23 -(2)	24 -(3)	25 -(4)	26 -(1)	27 -(3)	28 -(2)	29 -(1)	30 -(1)
31-(4)	32 -(1)	33 -(3)	34 -(2)	35 -(4)	36 -(1)	37 -(3)	38 -(4)	39 -(3)	40 -(4)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

II කොටස

(01) (i) ඒබ්‍රහම් ලින්කන්, සීලර්
ii දේශපාලන බලය, පරිපාලන බලය, සමාජ බලය, ආර්ථික බලය
iii සිංහල, දෙමළ, ඉංග්‍රීසි, මැලේ
iv තොග වෙළඳාම, සිල්ලර වෙළඳාම
v ආගමික වතාවත් කෙරෙහි යොමු වීම, මනෝ විද්‍යාත්මක අභ්‍යාශ මගින්, උපදේශනය මගින්, ස්වභාවික පරිසරය නිරීක්ෂණය.
vi කියුබාව, උතුරු කොරියාව
vii ★ ව්‍යවස්ථාදායක විධායක හා අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් ක්‍රියාවට නැංවීම.
★ පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය ඒකක වෙත විමධ්‍යගත කර තිබීම.
★ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන පනතක් මගින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම.
★ මධ්‍යම ආණ්ඩුවට ඕනෑම විටක විමධ්‍යගත කරන ලද පරිපාලන බලතල නැවත පවරා ගත හැකි වීම.
viii ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය
ix තේ, පොල්, රබර්, වී, ධාන්‍ය වර්ග, එළවළු, පලතුරු, මස්, මාලු, බිත්තර
x ශ්‍රී ලංකාව, ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය, භූතානය, නේපාලය, මාලදිවයින, ඇෆ්ගනිස්ථානය

02. i ★ වර්තමාන රාජ්‍යය භූමි ප්‍රමාණයෙන් විශාල වීම, වර්තමාන රාජ්‍යය අධික ජනගහනයකින් සමන්විත වීම.
★ සියලු පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමේ අපහසුතාවය.
★ සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම.
ii ★ පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම.
★ පුරවැසි අයිතිවාසිකම් පිළිබඳව පාලකයින් පාලිතයින් දැනුවත් වීම.
★ පාලකයින් අත්තනෝමතික ලෙස ක්‍රියා කළ හොත් එය වළක්වා ගත හැකි වීම අධිකරණයේ ස්වාධීනතාව ආරක්ෂා වීම.
★ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම.
★ නීතියේ රැකවරණය සැමට සමානව ලැබීම.
iii (a) ★ නිදහස් හා සාධාරණ මැතිවරණ.
★ නීතියේ ආධිපත්‍යය පැවතීම.
★ අධිකරණයේ ස්වාධීනතාව.
දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් සිටීම.
★ යහපත් ආර්ථික මට්ටමක් පැවතීම.
★ නිදහස් හා අපක්ෂපාතී ජනමාධ්‍යය පැවතීම.
(b) කරුණු වලට අදාලව ලකුණු ලබා දෙන්න විස්තර කිරීමට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

03. i පිහිටීම, සංක්‍රමණ, ආක්‍රමණ, විවිධ ජාතීන් වෙළඳාම සඳහා පැමිනීම, ශ්‍රමිකයින් ගෙන්වා ගැනීම.
ii ★ දූෂණයෙන් වංචාවෙන් තොර රාජ්‍යය පාලනය.
★ නිදහස හා සාධාරණත්වය තහවුරු වීම
★ අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු වීම මාධ්‍යය නිදහස ආරක්ෂා වීම.
★ විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීම, ව්‍යවස්ථානුකූලවාදය ආරක්ෂා කිරීම හා රැක ගැනීම .....
iii (a) ★ එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනා ගැනීම හා අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම එකිනෙකාට ගරු කිරීම.
★ අන්‍ය ආගම් වලට ගරු කිරීම.
★ අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
★ සාමූහිකත්වය වර්ධනය වීම.
★ අනෙකුත් ජනවර්ගවල භාෂාවන් ඉගෙනීම හා භාවිතය.
★ සර්ව ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම සමානාත්මතාවය.
(b) ලියා ඇති ගුණාංග වලට අදාළව ලියා ඇති වාසි සඳහා ලකුණු ලබා දෙන්න.
විස්තර කිරීමට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

04. i භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය.

ii කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේ ද ?
කෙසේ නිෂ්පාදනය කරන්නේ ද ?
කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද

iii (a)
- ★ විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම.
- ★ නව රැකියා අවස්ථා නිර්මාණය වීම නිසා සේවා වියුක්තිය අඩු වීම.
- ★ දේශීය නිෂ්පාදන සාධක වලට වැඩි ඉල්ලුමක් ඇතිවීම.
- ★ කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇතිවීම.
- ★ ජාත්‍යන්තර වෙළඳපොල පදනම් කරගත් දේශීය නිෂ්පාදන බිහිවීම ගෙවුම් ශේෂ තත්වය යහපත් කිරීම.
- ★ ආර්ථිකය විවිධාංගීකරණය වීමනිෂ්පාදන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පුළුල් වීම.

(b)
- ★ බහුජාතික නිෂ්පාදන සමග දේශීය නිෂ්පාදනයන්ට තරග කිරීමට නොහැකි වීම.
- ★ කාර්මික ආයතනවලින් සිදුවන පාරිසරික හානි ඉහළ යාම.
- ★ බුද්ධිගලනය වේගවත් වීම.
- ★ සංවර්ධිත රටවලින් සිදුවන බලපෑම ඉහළ යාම දේශීය සංස්කෘතියට විවිධ බලපෑම් එල්ල වීම විදේශ ණය හා ආධාර මත යැපීමට සිදුවීම දේශීය සම්පත් සූරා කෑමට ලක් වීම.
- ★ දේශීය යැපුම් ආර්ථික රටාව විනාශ වීම.
- ★ දේශීය ළදරු කර්මාන්තය විනාශ වී යාම.

විස්තර කිරීමට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

05. i පුද්ගලයා තුළ, පුද්ගලයින් අතර, ජන කණ්ඩායම් අතර, රටවල් අතර

ii ජීවිත හානි වැළකීම, සම්පත් දේපළ හානි වැළකීම, මූලික හා මානව අයිතීන් ආරක්ෂා වීම, මානසික ආතතිය අවම වීම, පුද්ගල මානසිකත්වය ඉහළ යාම, ආත්ම ගෞරවය සුරැකීම, දේශපාලන ස්ථාවරත්වය, ආර්ථික ස්ථාවරත්වය, රට සමෘද්ධිමත් වීම.....

iii (a) මතවාදී ගැටුම්, යුධමය ගැටුම්

(b) සම්පත්, බල ව්‍යාප්තිය, ආර්ථික ප්‍රතිලාභ

විස්තර කිරීමට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

06 i ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල

ii
- ★ රාජ්‍යයේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම.
- ★ සියලු ජන කොටස් පොදු හැඟීමෙන් යුතුව කටයුතු කිරීම.
- ★ මූල්‍යමය සම්පත් බෙදාහැරීමේදී ඒවා සාධාරණ ලෙස ප්‍රාන්ත ආණ්ඩු වෙත ලබා දීම.

iii (a)
- ★ විවිධත්වය පවතින ජන සමාජයක් තුළ විවිධත්වයට ගරු කිරීම මගින් පොදු ජාතිකත්වයක් ගොඩනගා ගැනීම
- ★ භූමි ප්‍රමාණය විශාල රාජ්‍යයවල පරිපාලන තින්දු ගැනීම පහසු වීම.
- ★ ප්‍රාන්ත ආණ්ඩු විසින් මධ්‍යම ආණ්ඩුවට කරන බලපෑම් හා මැදිහත්වීම හේතුවෙන් රාජ්‍යයක් අත්තනෝමතිකව ක්‍රියා කිරීම වැළකේ.
- ★ ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වේ.

(b)
- ★ බලතල බෙදා දීම තුළ ප්‍රාන්ත ආණ්ඩුවලට ලැබී තිබෙන බලතල වලින් ඔවුන් සමහරවිට තෘප්තිමත් නොවීම.
- ★ මධ්‍යම ආණ්ඩුව වෙතින් ප්‍රාන්ත වෙන්ව යාමට උත්සාහ ගැනීම පිළිබඳ ව ඇතිවී තිබෙන ප්‍රවණතාව මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර ව්‍යවස්ථාව මගින් තීන්දු ගැනීම තුළ යම් කිසි ක්ෂේත්‍රවලට අදාළ ව ගැටලුකාරී තත්වයක් මතු වීම හා එමගින් පරිපාලනය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම.
- ★ දෙවන මන්ත්‍රණ සභාවක් පැවතීම නිසා ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම.
- ★ ප්‍රාන්ත පරිපාලනය සඳහා හොඳ අතදැකීම් සහිත පළපුරුදු නිළධාරීන් අවම වීම හා එමගින් පරිපාලන ක්‍රමය බිඳ වැටිය හැකි වීම.

විස්තර කිරීමට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

07. i ඒකීය රාජ්‍යය, සන්ධීය රාජ්‍යය

ii රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ, පුනරුදය, වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදී ආර්ථිකයක් ගොඩ නැගීම, විද්‍යාත්මක දැනුම වර්ධනය.

iii (a)
- ★ නීතිය හා සාමය ආරක්ෂා කිරීම, සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම.
- ★ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම නීතියේ සාධාරණත්වය සුරක්ෂිත කිරීම.
- ★ රටේ සම්පත් සාධාරණව බෙදී යන පරිදි කටයුතු කිරීම.
- ★ රාජ්‍යය මුදල් පාලනයේදී විනිවිදභාවයෙන් කටයුතු කිරීම.
- ★ සමාජ සුරක්ෂිතභාවය හා සුභසාධනය ඇති කිරීම පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කිරීම.

(b)
- ★ රජයට නියමිත බදු ගෙවීම පවතින නීතියට ගරු කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම.
- ★ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට සහාය වීම.

විස්තර කිරීමට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank